ඔහු ජනේලය වෙතින් මෑත්ව ආපසු පැමිණ පුටුවේ වාඩි වූයේ ය. සිත දැඩි කර ගත යුතු ය. ජීවිතයෙන් පලා යන්නට නොහැකි ය. ජීවිතයට මුහුණ දිය යුතු ය. මේ ගමන යන්නට පටන් ගත්තේ නිෂාධි සමඟය. නිම කළ යුත්තේ ද ඇය සමගින්ම ය. අතරමඟ වෙන්ව යාමකට කෙසේවත් ඇයට අවසර දිය නොහැකි ය.

''මම ඔයත් එක්කම ඉන්නවා නිෂා..'' ඔහු තමාට ම මුමුණා ගත්තේ ය. වෙන්ව යාමකට වඩා එක්ව සිටීම සිතට සුවයක් ගෙන දෙනු ඇති බව නිසැක ය. ඇගෙන් තොර ජීවිතයක් ගැන සිතන්නට පවා තමාට නොහැකි බවක් දිලීපට දැනුණි.

කිසිවකු කාමරයේ දොරට සන් කරණු ඔහුට ඇසුණි.

''ඉටිස් මී දිලීප..'' ඒ සඳලිගේ කටහඬ ය.

දිලීප නැග ගොස් කාමරයේ දොර ඇරියේ ය.

''මම දැක්කා ඔයා එනවා.. මොකද මේ දොරත් අගුලු දාගෙන..'' සඳලි කාමරයට ඇතුල්වන අතර ඇසුවා ය. දිලීප පිළිතුරක් නොදී සිය පුටුවේ වාඩි වී ඇය දෙස බැලුවේ ය. ''මූණත් එක්ක ඇදිලා ගිහිල්ලා..'' සඳලි නැවත කීවා ය.

''හිතේ මොකක්දෝ ලොකු ප්‍රශ්නයක් තියාගෙන ඉන්න බව මූණ බලපු ගමන් පේනවා.. කියන්න අකමැති ද අපටත්.. සමහර විට ගොඩවෙන්න උදව්වක් කරන්නත් අපට පුලුවන් වෙන්න ඉඩ තියෙනවා..'' සඳලි කීවේ සිනාසෙමින් ය. දවසේ පළමු වතාවට දිලීපගේ මුහුණේ සිනාවක් ඇඳී ගියේ ය.

''අන්න එහෙම හිනා වෙලා ඉන්න ඕනෙ නේ.. ඒක නෙවෙයි.. යමු ද මර්චන්ට්ස් ඔෆ් බොලිවුඩ් බලන්න.. හරිම ලස්සනයි කියලා අයෝමත් මා එක්ක කිව්වා.. හින්දි සිනමාවේ කතාන්දරය නාට්‍යානුසාරයෙන්.. නියමයි නේ ද..? මට තනියෙන් යන්න කම්මැලියි අනේ.. යං.. මං ගානෙ බලමු..''

සඳලි සමගින් මේ සැන්දෑව ගත කර සිත සැහැල්ලු කරගත යුතු යයි දිලීපගේ යටි සිත කෑගැසුවේ ය. එහෙත් ඔහු නිහඬවම ඇය දෙස බලා සිටියේ ය.

''කල්පනා කර කර ඉන්න වෙලාවක් නෑ ළමයෝ.. තව පැයයි තියෙන්නේ.. යං .. යං..'' සඳලි නැගිටින අතරම මේසය මත වූ දිලීපගේ අතින් අල්ලා ගත්තා ය.

00000

''නිෂා... අනේ.. නිෂා..ධි'' අනුරාධ මිමිණුවේය. ''ඔයා හොඳින් ඉන්නවා නේද? කරදරයක් නැහැ නේද කියන්න.... ඇයි නිෂා මෙච්චර දවසක් කතා නොකළේ..? මම කොච්චර නම් බලා ගෙන හිටියද..'' අනුරාධ එකවර ප්‍රශ්න වැලක්ම අසා ගෙන ගියේය.

''මට ගෙදරින් කතා කරන්න පුළුවන් කමක් තිබුණෙ නැහැ අනුරාධ. ඔයාට කතා කරගන්න බැරුව මමත් හරිම අමාරුවෙන් හිටියෙ. මම හිතුවා ඔයාවත් කතා කරයි කියලා.. මට හරිම දුකයි අනුරාධ.....'' නිෂාධි කීවේ ඇත්ත ය. ''ඒත් මම දැනගෙන හිටියෙ නැහැ අපේ ටෙලිෆෝන් නම්බර් එක වෙනස් කරලා කියලා''

'' මම දන්නවා නිෂා... කමක් නැහැ.. දැන් ඔයා කතා කළා නෙ... ඉතින් කියන්න.. සතුටින් ඉන්නවා නේද..?''

''ඔව් රත්තරන් .. ගොඩාක් සතුටෙන්... ඔයා දන්නවද..? අද තමයි මගේ ජීවිතේ වැඩිම සතුටක් දැනුණ දවස..'' නිෂාධි කීවා ය. ''මට ඔයාට කියන්න වැදගත් දෙයක් තියෙනවා..''

''කියන්න..''
''අනුරාධ..''
'ඔව්..''
''අනුරාධ.. අපේ ආදරේ වෙනුවෙන් පුංචි පැටියෙක්.. අපි දෙන්නගෙ පුංචි පැටියට දැන් සති පහයි අනුරාධ''

''දෙයියනේ නිෂා..'' අනුරාධ ගේ ප්‍රීතිමත් කටහඬ නිෂාධි දුරකතනයෙන් අසා සිටියේ මහත් සතුටකිනි.

*ගිම්හානයයි මේ පසු කර යන්නේ*
*උදා වන වසන්තය අබියස*
*දහස් පෙති විහිදුවා ..*
*මුදු සුවඳ පතුරවා*
*වසන්තේ පැතුම් පොදි පුබුදුවා ..*

**ළබන කළාපයට**



විදෙස්ගත ශ්‍රීලාංකේය තරුණ පරපුර හා පවුල

# දැන ගියොත්..

**ඉඳහිටෙක,** මගතොටදි, පන්සලේදි හමුවෙන අපේ බොහෝමයක් හඳුනන අය මගේ ලිපි ගැන මාත්තෙක්ක කතා කරනවා. ඇත්තටම ඒක සතුටක්. එහෙම කතා කරද්දි ඔවුන්ට මෙහෙදි ඇතිවුණ ප්‍රශ්ණ, මේ රටේ ඔවුන් ජීවත් වෙන විදිය, අනිත් අය ගැන ඔවුන් හිතන විදිය, තමන්ගෙ ඇසුරෙ ඉන්න අයට කිවයුතු ඒත් මූණට ඒ දේවල් කියාගන්න බැරි දේවල් කිසිම වෙහෙසක් නොගෙනම ඔවුන්ගෙ හිත් වලින් එළියට එනවා. හුඟක් වෙලාවට ඊළඟට ලියන ලිපියට මම ඒ දේවල් පාදක කරගන්නවා.

මේ ලිපියෙ අඩංගු වෙන හුඟක් කරුණුත් ඒ වගේ පහුගිය දවසක අහම්බෙන් මගතොටදි මුණ ගැසුණු අපේ හිතවත් සොයුරියක හා කතාබහට ලක් කෙරුණු ඒවායි. ඕස්ට්‍රේලියාව ස්ථිර පදිංචිය කරගත් බොහෝ දෙනා අපේකම, සිංහලකම බොහෝ ඉහළින් අගය කරතත්; දිගු කාලයක් මෙහි රැඳී සිටීම හේතුවෙන් ඔවුනුත් යම් තරමකට මේ රටේ සමහර පුරුදු වලට හැඩ ගැසෙන බවක් ඇය මා සමඟ කළ කතාබහේදී සඳහන් කළා. නමුත් ඒවා විය යුත්තේ හොඳ අතටයි.

ලංකාවෙදි කිසිම අවසරයකින් හෝ කලින් දැනුම්දීමකින් තොරව අසල්වැසියන්, යහළුවන්, නෑදෑයන් ගෙ ගෙවල්වලට ගොඩ වැදුණ අපි දැන් පුරුදු වෙලා ඉන්නෙ දුරකථන ඇමතුමක් දීලා දිනයක්, වෙලාවක් නියම කරගෙන යන්නයි. ඇත්තටම ඒක කොයි තරම් හොඳ දෙයක්ද එදිනෙද වැඩ කටයුතු වලට කොයිතරම් පහසුවක්ද කියලා දැනෙන්නෙ අපිත් ඒ විදියට හැඩ ගැහුණට පස්සෙ.
මතකද? ලංකාවෙ ඉන්න කාලෙදි අපව පුදුමයට පත් කරන්නට හිතාගෙන කිසිම දැනුම් දීමකින් තොරව, හදිසියේ කඩා පනින එවන් නෑදෑයන්, හිතවතුන් නිසා එදිනෙද අපේ සියළු කටයුතු අවලංගු කර ඔවුන් වෙනුවෙන් කාලය වෙන් කරන්නට සිදුවුණු අවස්ථා ඕන තරම් අපේ ජීවිතවල තිබුණා. නමුත් දැන් නිවාඩුවකට හෝ ලංකාවට යන අපේ බොහෝ දෙනා මෙහෙන් ජීවිත වලට එකතු කරගත් එවන් හොඳ දේවල් වල ඇති වටිනාකම එහේ ජීවත්වන අපේ අයටත් අවබෝධ කරදෙන්නට උත්සාහ කරන බවත්, එවන් උත්සාහයන් කිහිපයක් සාර්ථක වූ බවත් ආරංචියි.

ලංකාවේ පොදු ප්‍රවාහන සේවාවන්වල දිනපතා ගමනාගමනය කියන්නෙ ලංකා-වෙදි අපිට එපාම කරපු දෙයක්. විශේෂයෙන්ම බසයකට නගිද්දි, ආපසු බසිද්දි අපේ හොඳ පණ ගිහින්. ඒ ඇයි? හේතුව තමයි රියැදුරන්ගෙන්, කොන්දෙස්තරවරුන්ගෙන් විතරක් නෙවෙයි සමහර ගමන් ගන්නා මගීන්ගෙන් පවා සිදුවන අපහසුතාවයන්. දිනකට කීදෙනෙක් නම් රණ්ඩු සරුවල් මැද බස් රථවලින් බහිනවද? නමුත් මෙහේ අපි, මෙහේ පුරුද්දට පොදු සේවාවන් වල ගමනාගමනයෙදි කොයිතරම් ආචාරශීලීද? බස් රථයකට ගොඩවන විට වගේම බස් රථයෙන් ආපසු බසිද්දිත් රියැදුරන්ට ස්තුති කරන්න, යහපත් දවසකට සුබ පතන්නට පුරුදු වෙලා. ඒත් හිතන්න ලංකාවෙදි බස් රථයකින් බසින්නටත් කලින් එළියට විසිවෙන අපිට රියැදුරන්ට ස්තුති කරන්නවත් වෙලාවක්වත්, ඕනකමක්වත් තිබුණාද?

මේ දේවල් තුළින් අපේ එදිනෙද ජීවිතවලට කොයිතරම් හොඳ දේවල් එකතු කරගත්තත් සමහර උදවියට නම් දරුවන්ව මිතුරු මිතුරියන්ගේ නිවෙස්වල රැයක් ගත කරන්නට යැවීම විලාසිතාවක් වෙලාලු. ඒත් මං දන්න විදියට අපේ හුඟක් දෙමව්පියන් තම දරුවන-'ට කොයි තරම් යහළුවන් ආශ්‍රයට ඉඩ දුන්නත් මෙහේ භාෂාවෙන් "කැව දඩැරි නමින් හඳුන්වන ඔවුන්ගේ නිවෙස්වල රැය ගත කරන්නට යාම අනුමත කරන්නේ නැහැ. ඇත්තටම මම දකින විදියට ඒක හොඳ දෙයක්. මගේ සොයුරු සොයුරියන් වගේම මම දන්න කියන හුඟක් සිංහල පවුල්වල අය තමන්ගෙ දුවාදරුවන්ගෙ මිතුරු මිතුරියන් ඇසුරට තහනම් නීති නොදැම්මත් ඔවුන් ඇසුරු කරන යහළු යෙහෙළියන් කවුද, ඔවුන්ගේ පවුල් පසුබිම කෙබඳුදැ'යි සොයා බලන්නට උත්සුක වෙනවා. නිවාඩු දිනයන්හිදී දිවාකාලය ඇවැසි නම් ඔවුන්ව තම පාසැල් යහළු යෙහෙළියන්ගේ නිවෙස් වල ගත කරන්නට යැවීමට මව්පියන් පෙළඹී සිටිනවා. එසේ කිරීමෙන් තම දුවාදරුවන්ගේ ඇසුරේ සිටින, ඔවුන්ගේ සමීපතම යහළු යෙහෙළියන්ගේ දෙමව්පියන් සමගද කතාබහ කරන්නට ඔවුන් දැන හඳුනාගන්නට අවස්ථාවක් ලැබීමෙන් තම දරුවා පිටස්තර නිවසක ගත කරන කාලසීමාව තුළ දරුවාට අනර්ථයක්, අනතුරක් නොවන බව දෙමව්පියන්ට වටහා ගැනීමට ලැබීම වැදගත්. දරුවා දුවෙක්ද පුතෙක්ද යන්න පිළිබඳව ගැටළුවක් නැහැ. දූ පුතුන් දෙගොල්ලන් පිළිබඳවම මව්පියන් එකසේම විමසිලිමත්වීම කාලෝචිත කරුණක්.

බිරිඳගෙන් වෙන්වී තම යොවුන් වියේ සිටින පුතුත් සමග කැනඩාවේ ස්ථිරව පදිංචිව සිටින අපේ සමීපතම සොයුරෙ-ක් දරුවන්ගේ පරිස්සම ගැන අපූරු අදහස් දරනවා. කැනඩාවද ඕස්ට්‍රේලියාව මෙන්ම විවිධ ජාතීන් බහුල රටක් නිසාත් ඔවුන්ගේ ඇසුරේ සිටින සිංහල පවුල් ඉතාමත් සීමාසහිත ප්‍රමාණයක් නිසාත් පුතුගේ යහළුවන් බොහෝ දෙනෙක් ඉන්දියානු, පිලිපීන ආදී ජාතිකයනුයි. නමුත් ඔහුගේ අදහස විශේෂයෙන්ම යොවුන් වියේ පසුවන දරුවන් ඉතාමත් පහසුවෙන් අයහපතට යොමුවිය හැකි බොහෝ දේවල් ඒ සමා-ජයේත් ඇති නිසා කුමන වැඩ කටයුතු මධ්‍යයේ වුවද ඔහු දරුවා පිළිබඳව වඩාත් විමසිල්ලෙන් කටයුතු කරන බවයි. ඒ බවට උදාහරණයක් දක්වමින් යහළුවෙකුගේ උපන්දින සාදයට සහභාගිවීමට පුතු ඇරයුම් ලැබීම නිසාත් මධ්‍යම රාත්‍රිය වනතෙක් සාදය පැවතීම හේතුවෙන් එවන් තැනෙක පුතු තනිකිරීම නුසුදුසු යැයි ඔහුට හැඟුණාත් තම දෑසවන් පුතුගේ සිත එවන් දෙයක් නිසා රිදවීමට ඇති අකමැත්ත හේතුවෙනුත් අපේ සොයුරා පුතුත් සමඟින් ඒ සාදයට සහභාගි වුණාලු. නමුත් එසේ සහභාගීවීමට පළමුව එම දෙමව්පියන්ට දුරකථන ඇමතුමක් දීමෙන් තමන්ද පුතු සමඟින් සාදයට සහභාගි වන බවත්, එසේ සහභාගීවීම හේතුවෙන් කිසිම විශේෂ සැලකීමක් බලාපොරොත්තු නොවන බවත් ඉඳ ගැනීමට අසුනක් පමණක් සෑහෙන බවත් කීවේලු. අවසන පුතු සමඟ සාදයට සහභාගි වී ඔහු දවස ගත කළ ආකාරය නෙත් පෙනෙන මානයේ සිට බලා සිට සාදය අවසන් වීමෙන් අනතුරුව මැදියම් රැයද ඉකුත්වී පුතු සමඟින්ම නිවසට පැමිණියේලු. ඒ නිසාම දැන් පුතු එවැනි මැදියම තෙක් පවත්නා සාදවලට සහභාගිවීමට අවසර ඉල්ලන්නේ නැතිලු. හේතුව යොවුන් වියේ පසුවන ඔහු ආරක්ෂා කිරීමට පියා සෑමවිටම ඔහු පසුපසින් සිටීම ගැන ඔහු නොසතුටට පත්වීම විය හැකියි. නමුත්; අපේ සොයුරා කියන්නේ පුතුට යම් අනර්ථයක් වුවහොත් එය, ඒ නොසතුටට වඩා සිය දහස් ගුණයකින් වැඩිවිය හැකි බවයි.ඉතින්; මෙවැනි තව කෙනෙකුගේ අත්දැකීමක්, හොඳ පුරුද්දක් අපේ ජීවිත වලටත් යහපත් ලෙස එකතු කරගැනීමට ලැබීම ඇත්තටම අපටත් යහපතක් නේද?

මේනකා ජයතිලක
ක්වීන්ස්ලන්තය


ඔබේ ශ්‍රී ලාංකික දන්ත වෛද්‍යවරයා



Dr Shahnaaz Ozeer
B.D.S. , Dip. Clin. Dent (Restorative) NZ
Dip. Clin. Dent (Oral Medicine) NZ

DENTIST

Facilities are also available for :
Mini implants
Whitening of teeth
Aesthetic dentistry
Preventive Care

1254 Plenty Road, Bundoora 3083
Tel : 03 9467 7760

Sannasa